# 13. ගෙත්සෙමන යාච්ඤාවෙන් සවිය

ජේසුස් වහන්සේ තම මෙහෙවර උදෙසා කැපවීමේ දී බොහෝ අභියෝගවලට මුහුණ පෑ ආකාරය අපි පසුගිය පාඩම් වලින් හැදෑරුවෙමු. උන්වහන්සේ තමන් ජීවත් වූ සමකාලීන සමාජයේ පීඩනයට ලක් වූවන්ගේ විමුක්තිය වෙනුවෙන් මැදිහත් වූ නිසාත්, මානව වර්ගයාගේ පාපයට කමාව ලබා දීම උදෙසාත්, ජේසුස් වහන්සේට ඉතා කටුක වේදනාවන්ට ලක් ව කුරුසිය මත තම ජීවිතය පරිත්‍යාග කිරීමට සිදු විය.

තම ජීවිතයේ අවසාන දින කිහිපයේ එම කටුක අත්දැකීම්වලට මුහුණ දීම උදෙසා ජේසුස් වහන්සේ යාච්ඤාව පෙරදැරිව 'ඉවසීම' හා 'ශක්තිය' ලබා ගත් ආකාරයත්, එය අපගේ ජීවිතවලට ගෙන එනු ලබන ආදර්ශය හා මග පෙන්වීම විමසා බැලීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

ශු. ලූක් 22: 39-53

## ලූක් 22:39-46
## ඔලීව කන්දෙහි යාච්ඤාව

පෙර පාඩමෙහි අප විමසා බලන ලද අන්තිම රාත්‍රී භෝජනයෙන් පසුව ජේසුස් වහන්සේ සිරිත් පරිදි තම ශ්‍රාවකයින් සමග ඔලීව කන්දට වැඩම කළ සේක. ඉදිරි දින කීපය තුළ තම දිවි ගමනෙහි අත්විඳින්නට නියමිතව තිබූ අභියෝග ජේසුස් වහන්සේ දැන සිටි සේක. සැබෑ මනුෂ්‍යයකු ලෙස මෙලොව ජීවත් වූ උන්වහන්සේට මෙතෙක් දැනුණ බඩගින්න, පිපාසය, දුක, සතුට මෙන් ම දැන් මරණයේ වේදනාව ද දැනෙන්නට වූවාට කිසිදු සැකයක් නැත. ජේසුස් වහන්සේ මෙම අවස්ථාවේ දී කෙතරම් සිත් වේදනාවෙන් පෙළුණ සේක් ද යත් මෙම පීඩාව තමන්වහන්සේගෙන් පහකරන ලෙස ඉල්ලා වඩාත් ඕනෑ කමින් යාච්ඤා කළ බවත්, මෙවිට උන්වහන්සේගේ දහදිය බිංදු ලේ බිංදු මෙන් බිමට වැටුණ බව ත් සඳහන් වේ.



රූපය 13:1 - ගෙත්සෙමන උයනේ යාච්ඤාව

"මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා"යි යන්න ජේසුස් වහන්සේ ඔලීව කන්දෙහි සිදු කළ යාච්ඤාවෙහි හරය වේ. තමන්ට අත්විඳින්නට සිදු වන දුක් වේදනා දැන දැනත් ජේසුස් වහන්සේ එලෙස පවසමින් 'තම කම සම්පූර්ණයෙන් නසා දැමූ බව' පසක් වේ. උන්වහන්සේ දැඩි සිත් වේදනාවෙන් කළ එම යැදුමට දේව ප්‍රතිචාරය වූයේ දේව දූතයෙක් ස්වර්ගයෙන් පහළ වී උන්වහන්සේ ශක්තිමත් කිරීම ය.

ජේසුස් වහන්සේ මෙලෙස ඔලීව කන්දෙහි සිදු කළ යාච්ඤාව තුළින් දේව කැමැත්තට කීකරු ව දුක් විඳීම හා මරණය කැමැත්තෙන් පිළිගත් සේක.

යමෙකුට දුක් විඳීමට සිදු වීම දේව කැමැත්තට විරුද්ධ ව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් බව එකල ජුදෙව් සමාජයේ සාමාන්‍ය පිළිගැනීම විය. එහෙත් ජේසුස් වහන්සේ තම දුක්විඳීම හා මරණය තුළින් අන්‍යයන්ගේ යහපත උදෙසා දේව කැමැත්තට එකඟව ක්‍රියා කළ සේක. දේව රාජ්‍යය උරුම කර ගැනීම සඳහා දුක් විඳීම වරප්‍රසාදයක් මෙන්ම අවසානයේ දී ජයග්‍රහණයක් ද වන බව උන්වහන්සේ මෙහි දී පසක් කර දෙන සේක. ඒ සඳහා මග පෙන්වීම ද ශක්තිය ද ධෛර්යය ද ලබා ගත හැකි වන්නේ යාච්ඤාව තුළින් බව තවදුරටත් අවධාරණය කර දුන් සේක.

තවද ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් සිට නැගිට ශ්‍රාවකයන් වෙත අවුත් ඔවුන් ශෝකය නිසා නිදා හිඳිනු දැක "පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න"යැයි වදාළ සේක. මෙලෙස තමන් වහන්සේගේ සිත් තැවුල මධ්‍යයේ පවා තම ශ්‍රාවකයන්ට ද යාච්ඤා කරන්න ධෛර්යය දුන් සේක. මෙලෙස ජේසුස් වහන්සේ මෙම තීරණාත්මක අවස්ථාවේ දී ඊට මුහුණ දීමට යාච්ඤාවෙන් ශක්තියත්, ධෛර්යයත් ලබාගත් ආකාරයෙන් අපගේ ජීවිතවලට ද මෙවැනි අභියෝග ඉදිරියේ යාච්ඤාව අදාළ කර ගැනීමට මග පෙන්වයි. ජේසුස් වහන්සේ අල්ලා ගැනීමට පෙර ශ්‍රාවකයන්ට යොමු කළ අවසාන ඉල්ලීම වූයේ ද "පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න" යනුවෙනි.

## ශු. ලූක් 22:47-53
## ජේසුස් වහන්සේ පාවා දීම

දොළොස් දෙනාගෙන් කෙනෙක් තමන්වහන්සේ පාවා දෙන බව අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී ජේසුස් වහන්සේ පෙර ඇඟවීමක් කළ සේක. ගෙත්සෙමන උයනේ දී එතැන සිටි අයගෙන් වෙන්කොට ජේසුස් වහන්සේ හඳුන්වා දෙනු සඳහා ජූදස් සිඹීම පිණිස උන්වහන්සේ වෙත ළඟා විය. ජුදෙව් සමාජයේ යමෙක් ගෞරවයෙන් පිළිගැනීමේ දී සිඹීම චාරිත්‍රානුකූල ව සිදු කරුණි. එහෙත් මෙම සිඹීම පාවා දීමේ ලකුණක් ලෙස ජේසුස් වහන්සේ හඳුනා ගත් සේක. මේ අවස්ථාවේ දී ජේසුස් වහන්සේ විසින් ජූදස්ට පැවසූ වදන් චෝදනා නැගීමක් නොව ශෝක ප්‍රකාශයක් මෙනි. මින් ජූදස් කෙරෙහි උන්වහන්සේ දැක්වූ අනුකම්පාව හෙළි වේ. පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප කිරීම ජේසුස් වහන්සේගේ පිළිවෙත නොවී ය.

ජේසුස් වහන්සේගේ ගෝලයන්ගෙන් එක් අයෙක් උත්තම පූජකයාගේ දාසයාගේ කණ කපා දැමූ විට තවත් එලෙස නොකරන්නට ගෝලයින්ට අණ කොට ඔහු සුවපත් කළ සේක. තව ද උන්වහන්සේ අල්ලන්නට ජූදස් සමග පැමිණි නායක පූජකයන් ඇතුළු පිරිසට උන්වහන්සේ දුන් පිළිතුරු ද මෙවන් මොහොතක ඔවුන්ගෙන් නිර්භීත ව ප්‍රශ්න ඇසීමට තරම් ධෛර්යයක් ජේසුස් වහන්සේට තිබීම ද පුදුමයට කරුණකි. ඇත්ත

වශයෙන් ම මේ සියළු කැපවීම් උන්වහන්සේ විසින් සිදු කරනු ලද්දේ ඔලීව කන්දෙහි සිදු කරන ලද යාච්ඤාවේ ශක්තියෙන් හා බලයෙනි.

මෙලෙස ක්‍රියා කිරීමට ජේසුස් වහන්සේට හැකියාව ලැබුණේ උන්වහන්සේ ගෙත්සෙමෙනේ උයනෙහි සිදු කළ ප්‍රබල යාච්ඤාව පෙරදැරි කරගෙන දේව කැමැත්තට කීකරු වූ නිසා ය.

කිතුනු දිවියකට යාච්ඤාවේ ඇති ප්‍රබල ශක්තිය හා වැදගත්කම ජේසුස් වහන්සේ මෙසේ අපට පසක් කර දෙන සේක.

ක්‍රියාකාරකම

පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප කිරීම ජේසුස් වහන්සේගේ පිළිවෙත නොවී ය.

1. මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ ක්‍රියාවට නැංවූ ආකාරය උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.